fly without wings

තටු නැතිව පියැබීම

“ජන සන්නිවේදන මාධ්‍යයන් ගේ සුවිශාල පරිණාමය හා සංවර්ධනයත් සමගම අද ලොකයේ සන්නිවේදන විප්ලවයක් ඇතිවී තබේ, ඒ අනුව මුළු ලොවම පුංචි පවුලක් බවට පත්වතිබේ”

මෙවැනි තත්වයක් ලොකයේ එසේ තිබියදී, මම 2008 වර්ෂයේ ඔක්තොම්බර් මස 29 වන දින ගුරු පත්වීමක් ලැබ, අම්පාර කලාපයේ දුෂකර කලාපයක් වන දමන කොට්ඨාසයේ දිදුලන පාසලක් වන අම්/උක්සිරිපුර විද්‍යාලයට පැමිණියෙමි. නමුත් එහි පරිගණකාසාරයක් තබා පරිගණකයක්ද නොතිබින. තවද මෙම ප්‍රදේශයේ පරිගණක පුහුණුව ලැබීමද මහත් දුෂකර කටයුත්තකි මන්ද ඒ සඳහා බොහෝ පහසුකම් හා සුදුස්සන් නොමැති බැවිනි.

මෙසේ කාලය කෙමෙන් ගෙවී යද්දී අපට Intel ආයතනයෙන් පරිගණක පුහුණුවක් ලබාදෙන බව දැනගන්නට ලැබින. හිතේ ඇති ආශාව හා උනන්දුව නිසාම මම 2010 වර්ෂයෙදී එම Intel ආයතනයෙන් මගින් කරන ලද Intel Teach Program ගුරු පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වුණෙමි. එම පුහුණුවෙන් පසු මා තවතවත් බොහෝ සේ පරිගණකයට ඇලුම් කළෙමි.

එහිදී මා හට ඔවා සිප් සතර ලැබ දී, ගිනිගහන කාෂ්ටක අව්වේ අම්පාර නගරයේ කාවන්තිස්ස විදුබිමේ කොම්පයටර් ගැන හොයමින්, බලමින්, අතගාමින් මා සමග හිඳිමින් මට දිරියදුන්, මග දෙගට දෙපා ගෑටූ ඉනටෙල ආයතනයේ සම්පත් දායකයෙකු වශයෙන් සේවය කරන අරුණ බාලසූරිය මහතාට මාගේ ගෞරවාදරය හා කෘතවේදීත්වය හිමිවිය යතුය.

“දඬු දෙක මගෙය වරපට නඹගෙය
ඉනි බින්දේ නුඹය ඉනි බැන්දේ මමය
ඒ වරපට මතින් තවමත්
දරා සටනේ නුඹය.....
පහන නොවණ දුර අහසෙ
නිවි නිවි දැල්වෙන තරුකැට
විලස පුංචි පාර්ථනා මාගේ සිත අවදි කලා”

2010 වර්ෂයේ දී Intel ආයතනය මගින් කරන ලද එම ගුරු පුහුණු වැඩ මුළුව සඳහා සහභාගී වෙමින් ලද පන්නරයෙන් පසු, මාගේ පාසලේ අනෙක් ගුරුවරුන් සඳහා එම පරිගණක පුහුණුව ලබාදෙන්න අවැසිතාවය මා හට තදින්ම දැනුණි. නමුත් පරිගණක පරිගණකාසාරයක් තබා පරිගණක්පවා අප පාසැලට නොතිබිණ.

නමුත් එයින් නොසැලුණු මා, අම්පාර මුවංගල විහාරයේ ඉවත් කරනු ලැබූ පරිගණක 4 ක් නැවත සකසා, මාගේ වියදමින් විදුලය ලබා ගැනීම සඳහා වයර්කොඩ් ද ගෙන, මුලින්ම මෙම පාඨමාලාව 2010 ජූන මස 20 දින ගුරුවරු 4 ක් සඳහා ආරම්භ කළෙමි. එය පාසලේ මහත් වෙනසක්

සිදුවිය .එයින් සති දෙකක් නික්ම යාමටද මත්තෙන් නැගෙනහිර පළාත් අධයාපන අමාත්‍යය ගරු විමලවීර දිසානායක මැතිතුමාගේ මඟ පෙන්වීම මත අප පාසලට පරිගණක විද්‍යාගාරයක් හමිවිය. එය මා ජීවිතයේ ලද සාරථකම අවස්ථාවකි.

පසුව පාසලේ විවිධ වැඩ හා අනෙක් ගුරුවරුන්ගේ විවිධ කම්කටොලු මැද වුවද මාගේ පාසලේ ආරම්භ කළ මෙම වැඩසටහන 2010 නොවැම්බර් මස 03 වන දා දකවා ගුරුවරු 27ක් පුහුණු කරනු කරන්නට ලැබිණි, අය මා ජීවිතයේ ලද විශිෂ්ඨතම ජයයි .

තවද අප පාසලේ විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය තුල සංවර්ධනය කළයුතු ප්‍රජානන, ආවේදන හා මනෝචාලක කෂේත්‍රයන් තව දුරටත් ශකතිමත් කිරීමට මෙම ඉන්ටෙල් වැඩසටහනෙන් ලැබෙන පිටුවහල අතිශය වැදගත්ය, සමබර පෞරුෂයක පිහිටන දරුවන් අනාගතයේ තමාට ආවේනික දර්ශනයක් හා ශෛලියකින් යුක්තව වැඩීමට මග පාදන, ගුරුවරුනට හිතකර යහපත් අනතර් සම්බනධතා ගොඩනැගෙන ආකාරයට එකනෙකා හඳුනා ගනමින් අන් අයනට උදව් කරමින් සහජීවනයෙන් විෂය නිර්දේශය සාමාන්‍ය ජීවිතයට දායක කරගනනේ කෙසෙද? යන්න මෙම පුහුණුවෙන් මනාව පසක් කරදුණි .

දැනම සඳහා සීමාවී ඇති අධ්‍යාපනය දරුවනගේ මනෝ සමාජීයය පැවැතම සඳහා විකල්ප මාර්ග ඔස්සේ පුහුණු කල යුතු අන්දම පිළිබඳ පුහුණුවද මෙම ගින් ලබාදුණි. ගුරුවරුන්ට පාඩම් සැලසුමක් සකස් කරනනේ කෙසේද? යන්න හා එමගින් ආත්ම විශ්වාසය ඇතිව පන්ති කාමරය තුළ පාඩම කරන ආකාරය පළිබඳ විග්‍රහයක් මේතුළින් ලබාගැනීමට හැකිවිය .

එමෙන්ම මෙම වැඩ සටහනෙන් පසු අප ලද ජයග්‍රහණ.

- ❖ අප පාසලේ ළමයින්ගේ මෙන්ම ගුරුවරුන්ගේ පරිගණක අධ්‍යාපනික දැනුම ඉහල නැංවීමට හැකිවීම.
- ❖ අම්පාර කලාපයේ පැවැත්වෙන මෘදුකාංග තරගාවලයෙදී අප පාසලේ ඉංග්‍රීසි විෂය උගන්වනු ලබන ෆලෝමිනා ප්‍රනාන්දු මහතමිය ප්‍රථම සථානය ලබා ගැනීමට හැකිවීම
- ❖ ගුරුවරුන් බොහොමයක් පන්ති කාමරය තුළ පරිගණක භාවිතා කරීම හෙතුවෙන් සිසුන්ගේ ප්‍රජානන හැකියාව මෙන්ම පාසලේ ප්‍රතිඵල ද වැඩිවිය.
- ❖ පාසලේ වෙබ් අඩවිය සකස් කළ යතු අන්දම පිළිබඳ පුහුණුවද මා තුළ වූ දැනම ඔප්නැන්වීම .
- ❖ එමෙනම 2012 ජුනි මස 07 වන දින පැවති නැගෙනහිර පළාතේ පාසල් මට්ටමින් පැවැත්විය යුතු Intel Teach ගුරු පුහුණව ඉතාසාර්ථක ලෙස නිමකළ ප්‍රධාන ගුරමහතුන් සඳහා ලබාදෙන High Performing Master Teachers සම්මානය ලැබිම.

Mr. Z. R. Faiz EP/ AM/ Uksiripura V. Eastern province receiving his plaque from the Provincial Director of Education EP.

High performance schools and teachers of Eastern Province with delegates from Eastern Province and Intel®.

මෙලෙස තිඹිරි ගෙදර සිට සොහොන් ගෙය තෙක් යන ජීවිතයේ දිගු ගමනේ පාර කියා දෙන අරුණැල්ලක් බඳු Intel ආයතනයට එකී කර්තව්‍යය තවත් ඉදිරියට කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවා! යන්න මාගේ පැතුමයි.

වැටකොට බැද පවුරු පදනම්
බැද තිබේ අකුරට සිව්දෙසු
එහෙත් බුද්ධියේ නිම් වළලූ පුළුල් කරු
බාධක මැද ජයගත යතුය..
ඒ කඩ ඉම.....

සුරේන් රිමාස් ෆායිස්
උපගුරු :ICT අම්/ උක්සිරිපුර විද්‍යාලය
මුවංගල
හඟුරාණ

Principals Message

As a proud a person of this area of my Alma mater, I consider myself privileged enough to pen down a few lines to the Intel. Intel gives us to produce healthy citizens with a balanced personality equipped with sufficient intellectual and moral where withal and armed with rich competencies to face any challenge in the modern world efficiently. We conduct a Intel Teacher Trainee Programmed on 20th of June to 03rd of November 2010 under the Administration of Intel. So our School is getting set to tread on a new path. "**We are moving Towards Glory**…"

Mr. T. G. Yaparathna

Principal

EP/ AM/ Uksiripura V.

Eastern Province.